

# මේ කාගේ දෝ කමතා

6

ජනතාව අතර ම නිර්මාණය වී පැවත එන ජන කවි සම්ප්‍රදායයක් අප රටේ ද දක්නට ලැබේ. ස්වකීය අත්දැකීම් රසවත් ප්‍රකාශන ලෙස සමාජයට දායාද කිරීමට ගැමි ජනයා සතු වූ කුසලතාව ජන කවියෙන් ප්‍රකට වේ. පාදක වූ අවස්ථා අනුව ජන කවි කමත් කවි, පැල් කවි, පාරු කවි ආදි වශයෙන් වර්ගීකරණයට ලක් කරනු දැකිය හැකි ය.

මෙම පාඩමට ඇතුළත් වන්නේ කමත් කවි කිහිපයකි. ගොයම් කපා කොළ මැඩීමේ දී ගොවියෝ මෙබඳු කවි ගායනය කරති. ගොයම් කෙතටත් නෙළා ගත් අස්වැන්නටත් ඔවුන් දැක්වූයේ ඉමහත් ගෞරවයකි. කමතේ සිරිත් විරිත් පැරණි ඇදහිලි ක්‍රම හා මිශ්‍ර වී ඇත. මහත් වෙහෙස ගෙන දෙන ගොයම් මැඩීමේ කාර්යයේ විනෝදයෙන් නියැලීමට කමත් කවි උපකාරී වේ.

කොළ මැඩීමේ යෙදෙන ගොනුන්ට දයාවෙන් අමතමින්, සාම්ප්‍රදායික විශ්වාසවලට ගරු කරමින් ගොවියා සිය කාර්යය ඉටු කර ගන්නා ආකාරය මෙම කවිවලින් පිළිබිඹු වේ.

# ජන කවි හඳුනා ගැනීම

ජනතාව අතරේ ම ඇති වී ජනතාව අතරේ ම ආරක්ෂා වී පැවත එන කවි, ජන කවි නමින් හැඳින්වේ. මේ ජන කවි, පොත්වල ලියවීමට පෙර පැවතුණේ ඒවා භාවිත කළ මිනිසුන්ගේ මතකයේ ය. එහෙයින් කාලයෙන් කාලයට භාෂාව වෙනස් වීමත් සමග ම ජන කවිය ද වෙනස් වීම ස්වාභාවික ය. පොත් පත්වල ලිවීමෙන් පසුව වුව ද බහුල වශයෙන් මිනිසුන් අතර භාවිත වන නිසා ඒවා තව දුරටත් වෙනස් වෙයි.

ජන කවිවල කතුවරයා හඳුනා ගත නො හැකි ය. පළමුවෙන් කියූ තැනැත්තා නො දන්නා නමුත් ඒවා ජනතාව අතර කාලයක් තිස්සේ භාවිත වීමෙන් පොදු අයිතියට පත්ව ඇත්තේ ය. ජනතාව අතර නිරායාසයෙන් පහළ වී ඔවුන් අතර ම පැතිර ගිය ජන කවියට වස්තු විෂය වී ඇත්තේ බෙහෙවින් ම ඔවුන්ට සමීප අත්දැකීම් ය. ඔවුන්ගේ එදිනෙදා අත්දැකීම්, ඇදහිලි විශ්වාස, ජීවනෝපාය, ක්‍රීඩා හා විනෝදාස්වාද මාර්ග, හැඟීම් ආදිය ඒ අතර බහුලව ම හමු වන තේමා ය.

සිංහල ජන කවිවල සුවිශේෂ ගුණාංග අතර අව්‍යාජත්වය, සරලත්වය සහ සංක්ෂිප්තභාවය හැඳින්විය හැකි ය. අලුත් උපමා රූපක භාවිතය ද ජන කවියාගේ ප්‍රතිභාව විදහා දක්වන ලක්ෂණයක් ලෙස සැලකේ. හැඟීම් ප්‍රකාශනයේ දී දැක්වූ සංයමය ද ඇතැම් ජන කවියක විශිෂ්ටත්වයට හේතු වී ඇත.

> "අපේ ජන කවි සාමූහික ජීවන රටාවේ වැදගත් ම දායාදයක් වැන්න. තනිව ම කියන ජන කවියක් අපට නැත. දරු නැලවිල්ල පවා කියන්නේ ඉතා අඩු වශයෙන් දෙදෙනෙකු වත් ඉන්නා තැනක ය. පැල් කවිය වුවත් පැලේ ඉඳ කියන විට රාත්‍රි පාළුව හා නිසංසලකම මකා ගෙන, පැල් රකිනා අවශේෂ උදවියගේ දෙසවන පතිත වන්නේ ය. ඒ අයගෙන් කෙනෙක් නිසැකව ම තවත් පැල් කවියකින් ඊට උත්තර සපයන්නේ ය. ඔරු පාරු කවි ගැන කිව යුත්තේ ද ඒ ටික ම ය. සාමූහික රටාවෙන් විනිර්මුක්ත වූ ජන කවියක් සිංහලයා අතර නො වී ය."
>
> නන්දසේන රත්නපාල, **ජනශ්‍රැති විද්‍යාව**

පහත දැක්වෙන කමත් කවි ද සාමූහික ක්‍රියාකාරකමක් වන කොළ මැඩීම හා සම්බන්ධ ය. මිනිසුන්ට පමණක් නො ව දෙවියන් සේ ඇදහූ ස්වභාව ධර්මයට ද කොළ මැඩීමට දායක වන ගවයන්ට ද එම කවිවලින් කමතට ඇරයුම් කෙරෙයි.

මේ කාගේ මේ කමතා
ඉරු දෙවියන්ගේ කමතා
ඉරු දෙවියෝ බිම් බදිතා
බිම් බැඳි තැන කොළ බදිතා

මේ කාගේ දෝ කමතා
සඳ දෙවියන්ගේ කමතා
සඳ දෙවියෝ වැඩි කමතා
සඳ දෙවියන් බැත දෙවතා

මේ කාගේ මේ කමතා
සැම දෙවියන්ගේ කමතා
සැම දෙවියෝ බිම් බදිතා
බිම් බැඳි තැන කොළ බදිතා

මේ කොතනින් ගෙනා ගොනා
දෙවුන්දරින් ගෙනා ගොනා
ඒ මොනවට ගෙනා ගොනා
කොළ මඩනට ගෙනා ගොනා

කෑලිය කොළ බැන්ද මටා
මදු කොළ බැන්දේ කුමටා
ඒ මට කළ හොඳ කමටා
කොළ මැඩවා දෙන් සොඳටා

ගලක් පළා ගලක් දුටිම්
එගල පළා රිදී දුටිම්
පැන් බොන්නට ළිඳක් දුටිම්
බැත උඩ සිට මුහුද දුටිම්

අටු කොටුවල තියෙන බැතා
ඉහළ පහළ තියෙන බැතා
ලබු ගෙඩිවල තියෙන බැතා
ගෙන පුරවා මේ කමතා

බුදුන් වඩින වේලාවයි
කිරි උතුරන වේලාවයි
කොළ මඩවන වේලාවයි
කමත පිරෙන වේලාවයි

## අරුත් පැහැදිලි කිරීම

| | |
|---|---|
| කමත | ගොයම් පාගන භූමිය/ස්ථානය/කලවිට |
| කොළ බඳිතා | කමත් බිමේ මැද කොළ වර්ග තැන්පත් කිරීම |
| බැත | වී |
| බිම් බඳිතා | කොළ මැඩීම සඳහා බිම සැකසීම, කිරි සහිත කොළ වර්ග හා උපකරණ වටේට තබා බිම සකස් කෙරේ |
| කොළ මැඩීම | ගොයම් පෑගීම |
| කැලිය කොළ | පඳුරු වශයෙන් වැවෙන කිරි සහිත පැළෑටියකි; නාග බැවිල/කොහු කිරිල්ල/ගස් කැලිය |
| මදු කොළ | හරකුන් කෑමට ප්‍රිය කරන ගිරිතිල්ල කුලයේ වැල් විශේෂයක්. මේවා හරකුන්ට කෑම සඳහා කමතෙහි තබනු ලැබේ. |

## අවබෝධය

1. **කමතට දේවාශීර්වාදය ලබා ගැනීමට උත්සාහ කර ඇති බවට උදාහරණ දෙකක් දෙන්න.**
2. **කොළ මැඩීමේ දී ගොනා වැදගත් බව ප්‍රකාශ වන කවිය ලියන්න.**
3. **"බැත උඩ සිට මුහුද දුටිමි" යන්නෙන් අදහස් වන්නේ කුමක් ද?**
4. **කොළ මැඩීම මහත් ආශීර්වාදයක් බව පැවසෙන්නේ කුමන කවියෙන් ද?**
5. **කමත පුරවන්න යැයි කියන්නේ කුමන බැතවලින් ද?**

# විරුද්ධාර්ථ පද

කිසි යම් පදයකින් ඉදිරිපත් කෙරෙන අර්ථයට, විරුද්ධ වූ අර්ථයක් වෙනත් පදයකින් ගෙන හැර දක්වන්නේ නම් එය **විරුද්ධාර්ථ පදයකි.**

උදා : ඈත - මෑත, දුක - සැප, හොඳ - නරක

සිංහල භාෂාවේ විරුද්ධාර්ථ පද කිහිප ආකාරයකට සෑදේ.

- නාම පදයකට හෝ ක්‍රියා පදයකට හෝ මුලින් උපසර්ගයක් යෙදීමෙන්
  උදා : නම්බුව - අවනම්බුව
- නාම පදයකට හෝ ක්‍රියා පදයකට හෝ මුලින් **නිපාත** පදයක් යෙදීමෙන්
  උදා : වෙනස් - නො වෙනස්
- **වෙනත් පදයක්** භාවිත කිරීමෙන්
  උදා : ඇති - නැති
  යන - එන

## ලිඛිත අභ්‍යාස

1. **පහත සඳහන් පදවලට සුදුසු විරුද්ධාර්ථ පද පාඩමෙන් සොයා ලියන්න.**

   i. ඉහළ -
   ii. නො ගෙනා -
   iii. නරක -
   iv. අවේලාව -
   v. යට -

2. **වරහනට පිටතින් දී ඇති පදයට සුදුසු විරුද්ධාර්ථ පදය වරහන් තුළින් තෝරා යටින් ඉරක් අඳින්න.**

   i. අවමාන (අසමාන, විමාන, සම්මාන)
   ii. අන්ත (අන්තර, සමාන්තර, අනන්ත)
   iii. අභ්‍යන්තර (නිරන්තර, බාහිර, අන්තර)
   iv. මෛත්‍රී (කරුණා, ක්‍රෝධ, වෛරී)
   v. යහගුණ (අවගුණ, අගුණ, දෙගුණ)

vi. උත්තම (උසස්, අධම, පහත්)
vii. ජාතික (විජාතික, අවජාතික, සහජාතික)

3. **තද කළු අකුරින් යෙදී ඇති පදයට සුදුසු විරුද්ධාර්ථ පදය හිස්තැනට යොදා වාක්‍ය සම්පූර්ණ කරන්න.**

   i. ගොවීහු .......................... කාලයේ ගොයම් කපා **රාත්‍රි** කාලයේ කොළ මැඩීම කරති.
   ii. කමතේ දී ගොනුන්ට අමතන්නේ ............................ නො ව **ආදරයෙනි.**
   iii. පොළව ............................ වුවත් පොහොර යොදා **සරු** අස්වැන්නක් ලබා ගත හැකි ය.
   iv. සමහර ගොවීහු මිනිසුන් ............................ කළත් දෙවියන් කෙරෙහි **විශ්වාසය** තබා කටයුතු කරති.
   v. කොළ මැඩීමේ කටයුතු සාර්ථකව කළ හැක්කේ **කම්මැළි** මිනිසුන්ට නො ව ............................ අයට ය.

## ප්‍රායෝගික අභ්‍යාස

1. **කවි පෙළ තාලානුකූලව ගායනා කරන්න.**
2. **කෘෂිකාර්මික ජීවිතයට සම්බන්ධ ජන කවි එක් රැස් කර පොත් පිංචක් සකස් කරන්න.**
3. **කමත් භාෂාවට අයත් වචන දහයක් සොයා ලියන්න.**